ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,753 – 2012 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා – 2012.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

තනතුරු - ඇබෑර්තු

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 මැයි මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 මාර්තු මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර	ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය
මහනුවර	මැදඳුම්බර	පලිස්පත්තුව බටහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා පාතඳුම්බර විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර

04-158

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

ශ්‍රී ලංකා දුම්රිය සේවය
ලංසු දැන්වීම
පුත්තලම මාර්ගයේ ඇති ගර්හිත දුම්රිය මගී මැදිරි හා වැගන් (බඩු පෙට්ටි) (Carriages and Wegons) විකුණා බැහැරලීම (Disposal)

කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය සේවා මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, පුත්තලම් දුම්රිය මාර්ගයේ (Line) හි ඇති ගර්හිත දුම්රිය මගී මැදිරි හා වැගන් (බඩු පෙට්ටි) විකුණා බැහැරලීම සඳහා (Disposal) මුද්‍රාතබන ලද ලංසු මිල ගණන් කැඳවනු ලැබේ.

(02) ලංසු භාරගැනීම 2012.04.25 වැනි දින ප. ව. 2.00 ට අවසන් වනු ඇත.

(03) දුම්රිය සේවා ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලය වෙත ගෙවිය යුතු රුපියල් 3,000 ක වටිනා ගෙවීම් (රුපියල් තුන් දහසක් පමණයි) යුත් ආපසු ගෙවනු නොලබන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2012.04.19 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, දුම්රිය සේවා ගබඩාවේ අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර (ෆෝර්ම) මත ලංසු ඉදිරිපත් කළ යුතු ය.

(04) කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය සේවා මූලස්ථානයේ කාර්යාලයේ දී ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්ම වූ වහාම, ලංසු විවෘත කරනු ලැබේ. මෙම විවෘත කිරීමේ අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණ සිටීමට අවසර ඇත.

05. මුද්‍රා තබන ලද ලංසු, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය සේවා මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති, වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ සිදුකළ යුතු ය.

06. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය සේවා ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය සේවා ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි වෙතින් විමසන්න.

(දුරකථන අංක : 011-2432044/2436818)

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන
කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 6929.
04-227

ශ්‍රී ලංකා දුම්රිය සේවය
ප්‍රසම්පාදන දැන්වීම
රබර් පෑඩ් 300,000 ක් ප්‍රසම්පාදනය

කොළඹ 10, ඕල්කට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) සභාපති විසින් රාත්තල් 80 රේල් සෙක්ෂන් කොන්ක්‍රීට් ස්ලීපර සඳහා රබර් පෑඩ් 3,00,000 මිලදී ගැනීමට නිෂ්පාදකයන් වෙතින් මුද්‍රාතබන ලද ලංසු කැඳවනු ලැබේ.

(02) 2012.05.09 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කෙරේ.

(03) ආපසු නොගෙවන රු. 2,500 ලංසු ලේඛන ගාස්තුවක් 2012.05.03 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙත ගෙවීම මගින් ලබාගත් ලංසු ලේඛන මගින් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

(04) 2012.05.09 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කළ වහාම කොළඹ 10, ඕල්කට් මාවත ශ්‍රී ලංකා දුම්රිය සේවය සාමාන්‍යාධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයනට මෙම අවස්ථාව සඳහා සහභාගි විය හැක.

(05) මුද්‍රා තබන ලද ලංසු පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම සිදුකළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

(6) කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යලයේ දී කිසිදු අයකිරීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂාව සිදු කළ හැකි අතර වැඩි විස්තර පහත ලිපිනයෙන් ලබාගත හැක.

දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, ඕල්කට් මාවත, කොළඹ 10.
දුරකථන අංක : 2432044 හෝ 2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන
කමිටුව, (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 6931
04-228

බඩු බාහිරාදිය විකිණීම්

ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය - කොළඹ
ත්‍රීරෝද රථ කොටස්, යතුරුපැදි හා භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාලව රාජසන්තක කරන ලද, හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් ත්‍රීරෝද රථ කොටස්, යතුරුපැදි හා නඩු භාණ්ඩ, 2012.04.28 දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසි කරනු ලබන කිසියම් ත්‍රීරෝද රථ කොටසක් හෝ යතුරුපැදියක් හෝ භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පනවනු ලබන දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ත්‍රීරෝද රථ කොටස් හෝ යතුරුපැදි හෝ භාණ්ඩ ප්‍රධාන රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිවේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතුය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

08. වෙන්දේසි කිරීමට නියමිත යතුරුපැදි, වෙන්දේසියෙන් මිළ දී ගත් දින සිට මාස 03 ක කාලයක් තුල නව අයිතිකරු නමට ලියාපදිංචි කරගත යුතු අතර එකී කාලයෙන් පසුව අදාල පැවරීම් සිදුකරන්නේ නම් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ නියමය පරිදි එසේ ප්‍රමාද වන එක් දිනකට රු. 100 ක් බැගින් වන පරිදි අමතර ගාස්තුවක් ගෙවීමට සිදුවේ.

රශ්මි සිංගප්පුලි,
කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත්.

2012 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව

අනු. තත්වය	නඩු	ලියාපදිංචි අංකය	චැසි අංකය	එංජින් අංකය	වර්ගය/මාදිලිය	වර්ණය	
1	අංක රහිත	Not Available	MD305G2BR50995277	Not Available	Hero Streem (Moped)	Blue	-
2	අංක රහිත	Not Available	MD 611CA2781A11128	Not Available	TVS Champ Moped	Blue	-
3	අංක රහිත	Not Available	Corroded and Damage	Corroded and Damage	Lambratta	Green	Scarp
4	අංක රහිත	Not Available	Corroded and Damage	Corroded and Damage	Bajaj	Red	Scrap
5	අංක රහිත	21-0962	Corroded and Damage	M24DA 059322	Bajaj	Beige	Scarp
6	30450/0[1]	21-9381	Corroded and Damage	Corroded and Damage	Bajaj	-	Scrap

---

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අප්‍රේල් මස 11 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2012 මාර්තු මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

ලක්ෂමන් ගුණවර්ධන,
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

අන අංකය	නඩු අංකය	විස්තරය	ප්‍රමාණය
7	අංක රහිත	වාහනයක කැබලි කරන ලද ඉදිරි ආවරණ ලෝහ වැට	-
8	අංක රහිත	නවන ලද 1 1/2' ප්‍රමාණයේ තඹ බට තොගය	-
9	අංක රහිත	වාහන ජැක්	01
10	අංක රහිත	යකඩ බෝලට් ඇණ ඇතුළත් උර	01
11	අංක රහිත	ලොකු තඹ මුට්ටි	01
12	අංක රහිත	පරණ වාහන බැටරි	10
13	P. R.68/02	TBM120241 දරන නැෂනල් වර්ගයේ 14" රූපවාහිනී	01
14	අංක රහිත	වාහන රිම්	09
15	අංක රහිත	රබර් හෝස් කැබලි තොගය	-
16	අංක රහිත	TG2628CN 08061093 දරන ටොයෝස්ටා වර්ගයේ ගෑස් ලිප්	01
17	අංක රහිත	60C 2370 දරන JVCවර්ගයේ DVD යන්ත්‍ර	01
18	අංක රහිත	විවිධ වර්ගයේ තරාදි	05
19	අංක රහිත	වාහන විදුලි ලාම්පු	02
20	අංක රහිත	රවුම් හැඩයේ තහඩු තොගය	-
21	අංක රහිත	ලෝහ ඇඳ විට්ටම් 02 යි පාපැදි රාමු	02
22	අංක රහිත	වාහනයක කැබලි කරන ලද ඉදිරි ආවරණ ලෝහ වැට	-
23	අංක රහිත	කළුපාට රබර් ආවරණය සහිත කේබල් රෝල	-
24	අංක රහිත	4' x 2' ප්‍රමාණයේ ජනෙල් ග්‍රිල්	02
25	අංක රහිත	තාර ෂීට් රෝල්	01
26	අංක රහිත	යකඩ වලින් සාදන ලද තට්ටු (2' පමණ උස)	01
27	අංක රහිත	2' x 2' ප්‍රමාණයේ යකඩ රාමු	01
28	අංක රහිත	5' පමණ උස පිත්තල පහන්	01
29	අංක රහිත	තලන ලද ඇලුමිනියම් කැබලි ඇතුළත් උරය	-
30	අංක රහිත	නවන ලද ඇලුමිනියම් කම්බි තොගය	01
31	අංක රහිත	අබලන් ඡායා පිටපත් යන්ත්‍ර කොටස්	-
32	අංක රහිත	ක්ලච්ප්ලේට් අඩංගු උර	02
33	අංක රහිත	විවිධ ප්‍රමාණයේ ඇලුමිනියම් බාර් කොටස් තොගය	01
34	අංක රහිත	ඇලුමිනියම් ඉනිමං	01
35	අංක රහිත	ඇලුමිනියම් කුඩා තාච්චි	03
36	A3355/4	අංක 11011 දරන ස්ටීරියෝ කැසට්	01
37	A3636/3	(i) යුනික් වර්ගයේ රේඩියෝව	01
	අංක රහිත	(ii) එරික්සන් වර්ගයේ පරණ ජංගම දුරකථන	02
	අංක රහිත	(iii) නොකියා වර්ගයේ පරණ ජංගම දුරකථන	01
	අංක රහිත	(iv) මෝටරෝලා වර්ගයේ පරණ ජංගම දුරකථන	01
	අංක රහිත	(v) ඇල්කාටෙල් වර්ගයේ පරණ ජංගම දුරකථන	01
38	A9585/4	Micro වර්ගයේ ගෘහස්ත දුරකථන	01
	A9585/4	Fuitsu වර්ගයේ ගෘහස්ත දුරකථන	01
	A9585/4	Steuqrtel වර්ගයේ ගෘහස්ත දුරකථන	01
	A9585/4	NEC වර්ගයේ ගෘහස්ත දුරකථන	01
	A2339/3	Stardust වර්ගයේ එමජන්සි ලයිට්	01
39	අංක රහිත	සැම්සුන්ග් වර්ගයේ 6RDR 401416A දරන ඩෙක් යන්ත්‍ර	01
40	අංක රහිත	රතුපාට කුඩා රයිස් කුකරය	01
41	අංක රහිත	ලොකු පැති කණ්නාඩි	02
42	අංක රහිත	වාහන කැසට්	01
43	අංක රහිත	ජනෙල් කොකු අඩංගු උරය	-
44	අංක රහිත	ඩෙට්ට්‍රෝන් වර්ගයේ කළු සුදු රූපවාහිනිය	01
45	අංක රහිත	ගිනි නිවන උපකරණවල ලෝහ ආවරණ	03
46	අංක රහිත	ඇලුමිනියම් කලය හා කොරහ	-
47	අංක රහිත	6' පමණ දිග යකඩ ඉන්න	01
48	අංක රහිත	6' පමණ දිග 2" ප්‍රමාණයේ යකඩ බට	01
49	අංක රහිත	5' පමණ උස පලංචි ජැක්	02
50	අංක රහිත	7' දිග 2" x 3" ප්‍රමාණයේ ඉරන ලද ලී කැබලි	02
51	අංක රහිත	6 1/2' දිග 4'' x 2'' ප්‍රමාණයේ ඉරන ලද ලී කැබලි	02
52	අංක රහිත	ගල් ටයර්	02
53	අංක රහිත	ප්ලග් බේස්	02
54	අංක රහිත	හීටර්	04
55	අංක රහිත	ස්පීකර්	02
56	අංක රහිත	ගිනිගල්	02
57	අංක රහිත	අබලන් ලාම්පු	01
58	අංක රහිත	විවිධ යකඩ කොටස් හා යන්ත්‍ර කොටස් අඩංගු ලී පෙට්ටිය	-
	අංක රහිත	(i) යකඩ ඉන්න	01
	අංක රහිත	(ii) පිකැස්	01
	අංක රහිත	(ii) ලොකු යකඩ මිටිය	01
59	අංක රහිත	පිගන් මැටි සින්ක්	03
60	අංක රහිත	ඇලුමිනියම් මුට්ටි	02
61	අංක රහිත	රිම් එක සහිත ත්‍රිවීල් ටයර්	02
62	අංක රහිත	ගොල්ෆ් පිති	10
63	අංක රහිත	පරණ අබලන් රේඩියෝවක කොටස්	-
64	අංක රහිත	පරණ වාහන බැටරි	04
65	අංක රහිත	4' දිග දඟර වානේ කම්බි	03
66	අංක රහිත	4' දිග ඇලුමිනියම් බාර්	17
67	අංක රහිත	5' දිග දුණු කොළ	02
68	අංක රහිත	භාවිත නොකළ වැසිකිලි පෝච්චි (පිඟන් මැටි)	05
69	අංක රහිත	පරණ බෑග් (2 1/2' x 15")	01
70	11515/5	පිත්තල පඩික්කම්	02
71	අංක රහිත	ඇලුමිනියම් ඇතිලි	03
72	අංක රහිත	ඇලුමිනියම් නෑඹිලි	05
73	අංක රහිත	ඇලුමිනියම් මැටිකෝප්ප	03
74	අංක රහිත	කුඩා තාච්චි	02
75	අංක රහිත	කොරස්	01
76	අංක රහිත	ලොකු ඇලුමිනියම් ඇතිලි	03
77	අංක රහිත	ඇලුමිනියම් සින්ක්	01
78	67004/3	විදුලි පංකා	01
79	අංක රහිත	ඇලුමිනියම් තහඩු මිටි	01
80	අංක රහිත	වාහන එංජින් කොටස්	-
81	අංක රහිත	තටු නවන ලදවිදුලි පංකා	01
82	අංක රහිත	දඬු අඬු	01
83	අංක රහිත	ලොකු වාහන බැටරි	01
84	අංක රහිත	හිතාචි වර්ගයේ පරණ කැසට්	01
85	අංක රහිත	විවෘත ගෑස් ලිප්	01
86	අංක රහිත	කරඩ්	03
87	අංක රහිත	කපන ලද ලොකු තහඩු තොගය	01
	අංක රහිත	(i) අයිවා වර්ගයේ කුඩා කැසට්	01
	අංක රහිත	(ii) සනී වර්ගයේ කුඩා කැසට්	01
88	අංක රහිත	තඹ භාජන	01
89	අංක රහිත	1 1/2" ප්‍රමාණයේ ස්ටොප් වෑල්ව්	20
90	අංක රහිත	2" ප්‍රමාණයේ වෑල්ව්	15
91	අංක රහිත	නින්ජා වර්ගයේ මදරු දඟර පෙට්ටි	08
92	අංක රහිත	සූර්යයා ගිනි පෙට්ටි බන්ඩල්	04
93	අංක රහිත	වාහන ඉදිරිපස ආවරණ කොටස්	02
94	අංක රහිත	යකඩින් සාදන ලද ඇඳුම් රඳවන	01
95	අංක රහිත	අඩි 04 ටියුබ් ලයිට්	18
96	අංක රහිත	බෑග්	02
97	අංක රහිත	අබලන් ගෑස් ලිප්	01
98	අංක රහිත	තලන ලද ඇලුමිනියම් කැබලි තොගය	-
99	අංක රහිත	පොලිතීන් රෝල්	01
100	අංක රහිත	නැෂනල් වර්ගයේ කාර් සෙට්	01
101	අංක රහිත	ඩෙන්ම් වර්ගයේ කුඩා රේඩියෝ	01
102	අංක රහිත	නෙම්කෝ වර්ගයේ කුඩා රේඩියෝ	01
103	අංක රහිත	සිටිසන් වර්ගයේ බිත්ති ඔරලෝසු	01
104	අංක රහිත	යකඩ පුටු	08
105	අංක රහිත	වාහන සංඥා පහන්	12
106	අංක රහිත	කලු පාට වය්ර් කොටස්	03
107	අංක රහිත	අබලන් රයිස් කුකර්	01
108	අංක රහිත	පනිට්ටු	01
109	අංක රහිත	ප්ලාස්ටික් කුඩ	02
110	අංක රහිත	කුඩා රෙදි ජීස්	05
111	අංක රහිත	සිරප් කම්බි (කුඩා) රෝල	01
112	අංක රහිත	ප්‍රෙස්ටිජ් කුකර්	01
113	අංක රහිත	පිලිප්ස් වර්ගයේ VCD ප්ලේයර්	01
114	අංක රහිත	අයිවා වර්ගයේ කැසට්	01
115	අංක රහිත	අබලන් සබ්වූෆර්	01
116	අංක රහිත	වාහන ජැක්	01
117	අංක රහිත	වාහන රිම් කප්	04
118	අංක රහිත	තැලීගිය ඇලුමිනියම් භාජන	03
119	අංක රහිත	විදුලි ලාම්පු කොටස් අඩංගු උර	01
120	අංක රහිත	ත්‍රීවීල් සීට්	01
121	අංක රහිත	පොසිලේන් තේ සෙට්	09
122	අංක රහිත	සුදුපාට බට	09
123	අංක රහිත	උදලු	03
124	අංක රහිත	සිව්ලින් විදුලි පංකා මෝටර	03
125	අංක රහිත	ඇලුමිනියම් කැබලි උර	01
126	අංක රහිත	ත්‍රීවීල් කාපට් කොටස්	03
127	අංක රහිත	යකඩ වංගෙඩි	01
128	අංක රහිත	ඇලුමිනියම් තහඩු රෝල්	03
129	අංක රහිත	කුඩා පෑස්සුම් උපකරණ	01
130	අංක රහිත	යකඩ කපන කතුරු	01
131	අංක රහිත	වට 04 ගෑස් ලිප්	01
132	අංක රහිත	පාපැදි කොටස් අඩංගු උර	01
133	අංක රහිත	ටී. වී. ස්ටෑන්ඩ්	01
134	අංක රහිත	රයිස් කුකර්	01
135	අංක රහිත	JVC වර්ගයේ ඩෙක් යන්ත්‍ර	01
136	අංක රහිත	නැෂනල් වර්ගයේ කැසට් රේඩියෝ	01
137	අංක රහිත	ප්ලාස්ටික් කුඩ	02
138	අංක රහිත	වාහන මෝටර්	01
139	අංක රහිත	විදුරු සහිත ප්ලාස්ටික් බේසම්	01
140	අංක රහිත	විදුලි ගිනිගල් යන්ත්‍ර	01
141	අංක රහිත	විදුලි ඩ්‍රිල් මැෂින්	01
142	අංක රහිත	විදුලි පංකා	05
143	අංක රහිත	කුඩා ස්පීකර්	01
144	අංක රහිත	බැටරි	05
145	අංක රහිත	CDරාමු	57
146	අංක රහිත	අබලන් ෆැක්ස් මැෂින්	01
147	අංක රහිත	සිටිසන් වර්ගයේ බිත්ති ඔරලෝසු	01
148	අංක රහිත	රොටි සාදන උපකරණ සෙට්	05
149	අංක රහිත	අබලන් රේඩියෝ	01
150	අංක රහිත	NEC වර්ගයේ රූපවාහිනී	01
151	අංක රහිත	යකඩ කපන මැෂින්	01
152	අංක රහිත	ඇලුමිනියම් කැබලි අඩංගු උර	01
153	අංක රහිත	යකඩ කැබලි තොගය	01
154	අංක රහිත	වාහන පැති කණ්නාඩි	05
155	අංක රහිත	වාහන සංඥා ලාම්පු	05
156	අංක රහිත	සෝනි වර්ගයේ සෙටප්	01
157	අංක රහිත	අයිවා වර්ගයේ බෑග්	01
158	අංක රහිත	LGවර්ගයේ DVD ප්ලේයර්	01
159	අංක රහිත	JVCවර්ගයේ ඩෙක් යන්ත්‍ර	01
160	අංක රහිත	නැෂනල් පැනසොනික් වර්ගයේ රේඩියෝ	01
161	අංක රහිත	විවිධ සෙරෙප්පු අඩංගු උර	16
	71871/01	(i) නොකියා වර්ගයේ ජංගම දුරකථන	01
	71871/01	(ii) නොකියා වර්ගයේ ජංගම දුරකථන	01
	71871/01	(iii) සෝනි එරික්සන් වර්ගයේ ජංගම දුරකථන	01
	B7471/01	(iv) නොකියා වර්ගයේ කැමරා ජංගම දුරකථන	01
	B7471/01	(v) නොකියා වර්ගයේ ජංගම දුරකථන	01
162	88336/02	අබලන් ජංගම දුරකථන	01
163	B61081/01	(i) නොකියා වර්ගයේ ජංගම දුරකථන	03
		(ii) මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන	01
		(iii) ලී කෝන් වර්ගයේ ජංගම දුරකථන	01
164	86992/02	නොකියා වර්ගයේ ජංගම දුරකථන	01
165	80140/02	නොකියා වර්ගයේ ජංගම දුරකථන	01
166	72305/02	සෝනි එරික්සන් වර්ගයේ ජංගම දුරකථන	01
167	55564/01	ගලවන ලද යතුරු පැදියක කොටස් තොගය-	
168	අංක රහිත	මකන කැබලි අඩංගු පෙට්ටි	01
169	අංක රහිත	වෑල්ඩින් කූරු අඩංගු පෙට්ටි	01
170	අංක රහිත	හුලං ගසන පොම්ප	01
171	අංක රහිත	රගර් බෝල	01
172	අංක රහිත	සෝනි TV දුරස්ථ පාලක	08
173	අංක රහිත	යකඩ මිටි	01
174	අංක රහිත	වේලා සටහන් යන්ත්‍ර	01
175	අංක රහිත	බේබි ඇත්කර්	01
176	අංක රහිත	රිම්	02
177	අංක රහිත	උණුසුම් බෝතල්	01

04-46

රජයේ නොවන දැන්වීම්

සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ නිවේදනය
සමාගමේ නම : සීලෝන් ඉන්වෙස්ට්මන්ට් වෙන්චර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 82987
සංස්ථාගත කිරීමේ දිනය : 2011 දෙසැම්බර් 08
ලියාපදිංචි කාර්යාලය : ලෙවල් 33, බටහිර කුළුණ, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
චාටි බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
04-128

නිවේදනයයි

වර්ෂ 2007, අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව අප මෙයින් නිවේදනය කරන්නෙමු.
සමාගමේ නම : ආර්පිකෝ වෙයාර්හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV82852
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.
සංස්ථාගත කළ දිනය : 2011 දෙසැම්බර් 02
රිචඩ් පීරිස් ග්‍රෘප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-157/1

නිවේදනයයි

වර්ෂ 2007, අංක 07 දරන සමාගම් පනතේ, 9 වැනි වගන්තිය ප්‍රකාර, පහතින් සඳහන් සමාගම සංස්ථාගත කළ බව අප මෙයින් නිවේදනය කර සිටින්නෙමු.
සමාගමේ නම : ආර්පිකෝ හොස්පිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නම : PV83016
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.
සංස්ථාගත කළ දිනය : 2011 දෙසැම්බර් 9 වැනි දින.
රිචඩ් පීරිස් ග්‍රෘප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-157/2

නිවේදනයයි

වර්ෂ 2007, අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදය ප්‍රකාර, පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් නිවේදනය කෙරේ.
සමාගමේ නම : ආර්පිකෝ ඇටරැක්සියා ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 80658
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.
සංස්ථාගත කළ දිනය : 2011 අගෝස්තු 15
රිචඩ් පීරිස් ග්‍රෘප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-157/3

නිවේදනයයි

වර්ෂ 2007, අංක 07 දරන සමාගම් පනතේ 9 (1) සහ (2) වගන්ති ප්‍රකාර, පහත සඳහන් සමාගමේ නම වෙනස් කළ බවට අප මෙයින් නිවේදනය කර සිටින්නෙමු.
සමාගමේ නව නාමය : රිචඩ් පීරිස් ආර්පිකෝ ෆිනෑන්ස් ලිමිටඩ්
සමාගමේ පෙර නාමය : ද ආර්පිකෝ ෆයිනෑන්සියල් සර්විසස් ලිමිටඩ්
සමාගමේ අංකය : PB 4751
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 310, හයිලෙවල් පා, නාවින්න, මහරගම.
සමාගමේ නම වෙනස් කළ දිනය : 2011 අගෝස්තු 09
රිචඩ් පීරිස් ග්‍රෘප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-157/4

සමාගමේ නාමය වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වැනි වගන්තිය යටතේ සමාගමක නාමය වෙනස් කිරීම ලියාපදිංචි කිරීම සම්බන්ධව ප්‍රසිද්ධ දැන්වීම
පහත සඳහන් සමාගමේ නාමය 2009 අප්‍රේල් මස 30 වැනි දින සිට පහත සඳහන් පරිදි වෙනස් වී ඇත.
කලින් ව්‍යවහාර වූ නාමය : නිව් ගෝල්ඩ් ස්ටාර් සෝම්ල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PB 60080
කාර්යාල ලිපිනය : ගාලු පාර, පොතුපිටිය, වාද්දුව
නව සමාගමේ නාමය : ඉන්ජිනියස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලේකම්වරු.

04-153

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම නාමය වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ පැරණි නාමය : මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ස් පීඑල්සී
සමාගමේ අංකය : පීබී 76 පීකියු
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 236, ගාලු පාර, කොළඹ 03
සමාගමේ අලුත් නම : මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
අධ්‍යක්ෂ මණ්ඩලය.

අංක 236, ගාලු පාර,
කොළඹ 03.
04-148

ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර අපි නිවේදනය කරමු.
සමාගමේ නම : එම්. ජී. මෙඩිකල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : PV 77833
ලියාපදිංචි ලිපිනය : 355/1/2, ඉඳිගහමුල, කිරිල්ලවල, වැබඩ
සංස්ථාගත කළ දිනය : 2011.03.17
මාස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට් (පෞද්ගලික) සමාගම.
ලේකම්.

04-143

සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය
සමාගමේ නම : සොෆ්ට් මොබයිල්ස් (පීවීටී) එල්ටීඩ්
සමාගමේ අංකය : PV84906
සංස්ථාගත කළ දිනය : 2012.03.15
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 74/1, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.
සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට්
සර්විසස් (පෞද්ගලික),
සමාගම් ලේකම්වරු.

අංක 96- 2/2, මල්වත්ත පාර, කොළඹ 11
2012 මාර්තු මස 20 වැනි දින.
04-206/1

සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය
සමාගමේ නම : අවුරා ලොජිස්ටික්ස් (පීවීටී)එල්ටීඩ්
සමාගමේ අංකය : PV 84851
සංස්ථාගත කළ දිනය : 2012.03.14
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 37/1,එෆ්, දෙවන හරස් වීදිය, කොළඹ 11
සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට්
සර්විසස් (පෞද්ගලික),
සමාගම් ලේකම්වරු.

අංක 96- 2/2, මල්වත්ත පාර,
කොළඹ 11
2012 මාර්තු මස 20 වැනි දින.
04-206/2

සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය
සමාගමේ නම : ස්මාර්ට් වෝක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : 81116
සංස්ථාගත කළ දිනය : 2011.09.14
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 09, ලොරිස් පෙදෙස, ඩුප්ලිකේෂන් පාර, කොළඹ 04.
සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට්
සර්විසස් (පෞද්ගලික),
සමාගම් ලේකම්වරු.

2012 මාර්තු මස 02 වැනි දින.
04-206/3

සංස්ථාපනය කිරීම පිළිබඳ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ නිවේදනය
සමාගමේ නම : සුප්‍රීම් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කිරීමේ දිනය : 2012 පෙබරවාරි 14 දින
ලියාපදිංචි කාර්යාලය : ලෙවල් 3, 3 බටහිර කුළුණ, එච්ලන් චතුරස්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
චාටි බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

141/3, වෝක්ෂෝල් වීදිය,
කොළඹ 02.
04-127

මහජනතාව වෙත දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක (1) කොටසට අනුකූලව 2007 දෙසැම්බර් 06 වැනි දින ක්‍රියේටිව් ටෙක්ස්ටයිල් මිල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ස්ථාපනය කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

සමාගමේ නාමය : ක්‍රියේටිව් ටෙක්ස්ටයිල් මිල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 62311
ලියාපදිංචි කාර්යාලය : අංක 44ඒ, ඩික්මන් පාර, කොළඹ 05.
04-125

සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගමේ නම 2012 පෙබරවාරි මස 23 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2007 අංක 07 දරන සමාගම් පනත (8 වැනි වගන්තියට අනුගාමීව) අනුව වෙනස් කරන ලද බව එම පනතේ 9(2) වගන්තියට අනුගාමීව මෙයින් ප්‍රසිද්ධියේ නිවේදනය කරනු ලැබේ :-
සමාගමේ කලින් තිබූ නම : එක්ස්ටෙන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 1155
ලිපිනය : අංක 118/2, කොටා පාර, කොළඹ 08
නව නාමය : එක්ස්ටෙන් ප්‍රොඩක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.
අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
04-126

සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය
සමාගමේ නම : ඉන්ට මිම්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 68045
සංස්ථාගත කිරීමේ දිනය : 2009 ජූනි 17
ලියාපදිංචි කාර්යාලය : අංක 99/3 එච්, ගල්වල පාර, දෙහිවල.
චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.
අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
04-130

සමාගමේ නම වෙනස් කරන ලද බවට කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනය

2012 පෙබරවාරි මස 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් සමාගමේ නම වෙනස් කරන ලද බව (8 වැනි වගන්තියට අනුගාමීව) 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තියට අනුගාමීව මෙයින් ප්‍රසිද්ධ නිවේදනය කරනු ලැබේ.
කලින් තිබූ නම : යූ. එස්. ට්‍රැවල්ස් කලම්බෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 82698
ලිපිනය : 1 බී, 1 වැනි මහල, "නිර්මල්ගා රෙසිඩන්සීස්" අංක 12, නිමල්කා උද්‍යානය, කොළඹ 03.
නව නාමය : හෝස්මාන් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
චාට් බිස්නට් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.
අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
04-129

සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ, 9(1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.
සමාගමේ නම : Ehaliyagoda Holdings (Pvt.) Ltd.
සංස්ථාගත කළ දිනය : 2012.02.14
ලියාපදිංචි අංකය : PV84327
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 04, 1 මහල, ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල, ඇහැලියගොඩ.
දොස්තර ජේ. එම්. ඩී. ආරියරත්න,
සමාගමේ ලේකම්.
(වරලත් ගණකාධිකාරී).
04-135

සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි
සමාගමේ නම : WALGAMA AYURVEDIC PRODUCTS (PVT) LTD
සංස්ථාගත කළ දිනය : 2012.02.15
ලියාපදිංචි අංකය : PV 84299
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : වියළාගොඩ, ඇහැලියගොඩ.
දොස්තර ජේ. එම්. ඩී. ආරියරත්න,
සමාගමේ ලේකම්.
(වරලත් ගණකාධිකාරී).
04-134

නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියට අනුගාමීව සමාගමක් ලියාපදිංචි කළ බව දැනුම් දීම.
සමාගමේ නාමය : ලයන්ස් ක්‍රිප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 78377
සංස්ථාගත කළ දිනය : 2011.04.19
ලියාපදිංචි කාර්යාලය : අංක 40 A, මහ වීදිය, හැටන්.
සමාගමේ ලේකම්.
04-101

සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.
සමාගමේ නම : සැෆ්රන් ඒවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 84728
සංස්ථාගත කළ දිනය : 2012.03.08
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 130, ග්ලෙනි වීදිය, කොළඹ 02.
සමාගමේ ලේකම් : කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්ගේ අණ පරිදි.
04-107

ඇටර්නි බලය අවලංගු කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මැටියාමුල්ල, වලගෙදර පදිංචි ඩී. එස්. කේ. ආරච්චි වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් එම්. ආර්. හයිඩර් හසන් විසින් 2011.03.17 දින ලියා සහතික කරන ලද අංක 1319 දරන ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත් කරන ලද, ශ්‍රී ධම්මානන්ද මාවත, මාලේවලපුර, රත්තොටුවිල පදිංචි ආර්. අයි. රුවන් කුමාර (ජා. හැ. අංක. 803011613V) යන අයගේ එකී පත්වීම 2012.03.09 දින සිට අවලංගු කොට බල රහිත කරන ලද බව ශ්‍රී ලංකාවැසි සැමට මෙයින් දන්වා සිටිමි.
04-133

ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බෙලිඅත්ත දම්මුල්ල මිල්ලගාහේනේ පදිංචි තුෂාර රුවන්ප්‍රිය වන්නිගම වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් එච්. පී. ජී. සතරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 398 සහ වර්ෂ 2006ක් වූ ජූනි මස 05 දින දරන ඇටර්නි බලකරය මගින් මොදරවාන පල්ලත්තර "නිල්මිණි" නිවසේ පදිංචි කහදගමගේ ධම්මික ප්‍රභාත් සාගර යන අය වෙත පවරා දී තිබූ ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන ලද බවත්, ඔහු විසින් එකී අංක 398 දරන ඇටර්නි බලකරය මගින් මින් ඉදිරියට කරනු ලබන කිසිදු කටයුත්තකට මා විසින් වග කියනු නොලබන බවත්, සියලුම මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.
04-93

දැන්වීමයි

2007 අංක දරන සමාගමේ 9(1) වගන්තියේ ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීමේ නිවේදනය කරනු ලැබේ :-
සමාගමේ නම : මීවුස් ප්‍රොෆෙෂනල් ලංකා (පීවීටී) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 84301
සංස්ථාගත කළ දිනය : 2012.02.27
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 195, මාතර පාර, උණවටුන, ගාල්ල.
04-104

නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියට අනුගාමීව සමාගමක් ලියාපදිංචි කළ බව දැනුම් දීම
සමාගමේ නාමය : රීගල් නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 79407
සංස්ථාගත කළ දිනය : 2011 ජූනි 14
ලියාපදිංචි කාර්යාලය : අංක 79, මහ වීදිය, හැටන්
සමාගමේ ලේකම්.
04-102

නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්ති ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.
සමාගමේ නම : රමේකා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 80275
ලියාපදිංචි කාර්යාලය : අංක 124/ඒ, දුටුගැමුණු වීදිය, කොහුවල, නුගේගොඩ
මනුජා පනාවල,
සමාගම් ලේකම්.
04-98

ඇටෝර්නි බලකරය අවලංගු කිරීම/ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

මහවැව, මැද මහවැව, "සැනසුම" හි පදිංචි චන්දන මලියරත්න වන මම, දංකොටුව ප්‍රසිද්ධ නොතාරිස් මෙල්වින් සිල්වා විසින් වර්ෂ 2007.10.08 වැනි දින ලියා සහතික කළ අංක 2176 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මහවැව, මැද මහවැව, ධාතුසේන මාවත හි පදිංචි මේරි නෙල්වින් දනසීලි සිල්වා නමැති අයට ලබාදුන් ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු මහජනතාවටත්, අන් සියලු දෙනාටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.
එකී ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් ඇටෝර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ කිසිදු ගණුදෙනුවක් සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් බාරගනු නොලැබේ.
චන්දන මලියරත්න.
2012 මාර්තු මස 20 වැනි දින.
04-91

බිස්නස් මේට් (පුද්ගලික) සමාගම
සමාගම ලියාපදිංචි අංකය PV8017
45 (දෙවැනි මහල) බේබෲක් වීදිය, කොළඹ 02

දුරකථන අංකය 011-2433933, ෆැක්ස් අංකය : 011-2445683,
ඊමේල් :secy@hlblk.com.
2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 11(5) වැනි වගන්තිය ප්‍රකාරව පහත නම සඳහන් සමාගම ඒසියා සියකා කොමෝඩිටීස් (පුද්ගලික) සමාගම 2012 මාර්තු මස 08 වැනි දින සිට "ඒෂියා සියකා කොමෝඩිටීස් සමාගම" නමින් නම වෙනස් වීම පිළිබඳ මෙය දැනුම් දීමයි.
සමාගමේ නම වෙනස් වීම පිළිබඳ විස්තර පහත දැක්වේ.
සමාගමේ අලුත් නම : ඒෂියා සියකා කොමෝඩිටීස් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : PV3562
සමාගමේ ලිපිනය : අංක 120/15, විද්‍යා මාවත, කොළඹ 07.
බිස්නස් මේට් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.
අංක 45, බේබෲක් වීදිය,
කොළඹ 07.
04-35

ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නම : ස්මාර්ට් පී සී (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2007 ජූලි 24
සමාගම් අංකය : PV60758
ලිපිනය : අංක 517, 519, ගාලු පාර, කොළඹ 04.
අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි.
04-42/1

ප්‍රසිද්ධ නිවේදනය

පහත දැක්වෙන සමාගම පනතින් විස්තර කර ඇති නම සහ අංකය යටතේ සංස්ථාපනය කර ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.
සමාගමේ නම : සී. එම්. මාරසිංහ ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2011 සැප්තැම්බර් 27
සමාගමේ අංකය : පී. වී. 81524
ලියාපදිංචි කාර්යාලය : අංක 25/6, ධර්මායතනය පාර, කලල්ගොඩ, හෝකන්දර දකුණ, හෝකන්දර.
අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.
04-42/2

ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නම : සල් සල් ට්‍රේඩිං (පීවීටී) එල්ටීඩී
සංස්ථාගත කළ දිනය : 2011 ඔක්තෝබර් 12
සමාගමේ අංකය : PV81833
ලිපිනය : අංක 136/1, A මාවත්ත පාර, කොළඹ 14.
අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි.
04-42/3

දැන්වීමයි
සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ ලියාපදිංචිය පිළිබඳ දැන්වීමයි.
සමාගමේ නම : දියාගල් චැලට්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : PV84143
ලියාපදිංචි දිනය : 2012.02.21
ලියාපදිංචි ලිපිනය : අංක 35/7, කව්රත්න පෙදෙස, පාමංකඩ
කොළඹ 06
බිස්නස් මේට් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.
2012 පෙබරවාරි මස 23 වැනි දින,
අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02
04-37

නම වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ 9(2) වගන්තිය අනුව සමාගමේ නම වෙනස් කිරීම පහත පරිදි වේ.
සමාගමේ පෙර නාමය : ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි කම්පැණි ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීබී 113
සමාගමේ ලියාපදිංචි කළ
කාර්යාලීය ලිපිනය : අංක 46/46, දෙවැනි මහල, ශ්‍රීන්ලංකා ටවර්ස්,
නවම් මාවත, කොළඹ 02
නව සමාගම් නාමය : යුබි ෆිනෑන්ස් කම්පැණි ලිමිටඩ්
කළමනාකාරීත්වය වෙනුවෙන්,
නිරෝෂා කන්නන්ගර,
සමාගම් ලේකම්.
04-28

සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම
2007 අංක 07 දරන සමාගම් පනත
346 (1) වගන්තිය ප්‍රකාර ඇවරකරුවෙකු පත්කිරීමේ නිවේදනය

සමාගමේ නම : ටෝටල් ක්‍රෙඩිට් සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : අංක 101, ගාළු පාර, කොළඹ 04
ඇවරකරුගේ නම හා ලිපිනය : නීතිඥ සී. එල්ලාවල මිය,
අංක 52/8, මිරිහාන පාර, නුගේගොඩ.
අනුමැතිය දී ඇත්තේ : සමාගමේ සාමාජිකයින් විසින්
පත්කිරීමේ දිනය : 2012 මාර්තු මස 10 වැනි දින
04-30/1

ටෝටල් ක්‍රෙඩිට් සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම
සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම
2007 අංක 07 දරන සමාගම් පනතේ 346(1) වගන්තිය යටතේ දැන්වීම

ඉහත සමාගමේ සාමාජිකයින් විසින් 2012 මාර්තු මස 02 වැනි දින කොළඹ 4, ප්‍රැන්ක්ෆර්ඩ් පෙදෙස, අංක 15 ස්ථානයේ නිසි ලෙස පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලදී.
විශේෂ යෝජනා සම්මතය - සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම.
"සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ කාර්ය සඳහා අංක 52/8, මිරිහාන පාර, නුගේගොඩ පදිංචි නීතිඥ චන්ද්‍රා එල්ලාවල මහත්මිය සමාගම් ඇවරකරු ලෙස පත්කිරීමට යෝජනා සම්මත කරන ලදී".
නීතිඥ චන්ද්‍රා එල්ලාවල,
ඇවරකරු.
අංක 52/8,
මිරිහාන පාර,
නුගේගොඩ.
04-30/2

දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9(1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතන සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.
සමාගමේ නම : ෆීප් ෆ්‍රෙයිට් මැනේජ්මන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 84132
ලියාපදිංචි දිනය : 2012.02.08
ලියාපදිංචි ලිපිනය : අංක 65/7, ඩී එස්. සේනානායක මාවත, කොළඹ 08
සමාගමේ නම : ඒ ඒ වන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : 84408
ලියාපදිංචි දිනය : 2012.02.22
ලියාපදිංචි ලිපිනය : අංක 37/2, උපනන්ද බටුගෙදර මාවත, චැපල් පටුමග, නුගේගොඩ.
ඩබ්. එස්. වීරමන්,
ලේකම්.
අංක 27/1, පැපිලියාන පාර,
නැදිමාල, දෙහිවල.
04-29

ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (01) වගන්තිය ප්‍රකාර, ප්‍රසිද්ධ දැන්වීමයි

ආයතනයේ නම	පීවීවී අංකය	ලියාපදිංචි ලිපිනය
පින්ක් එලිෆන්ට් ප්‍රෙපර්ටිස් (ප්‍රයිවට්) ලිමිටඩ්	පීවී 83278	අංක 187සී, පිල්ලගොඩ, උණවටුන, ගාල්ල
ඒටීසී ෂිපිං ඇන්ඩ් ලොජස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්	පීවී 78237	අංක 73/15ඒ, පන්සල පාර, ඕෆ් කිරුලපන මාවත, කොළඹ 06.
ට්‍රස්ට් ජෙම්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්	පීවී 71955	අංක 44/1, ෂෙයික් අල් ෆාසි මාවත, චීන කොටුව, බේරුවල
පෙඩ්ලර්ස් ඉන් කැෆේ (ප්‍රයිවට්) ලිමිටඩ්	පීවී 82497	අංක 92, පෙඩ්ලර්ස් වීදිය, කොටුව, ගාල්ල
ද ජෙම් වර්ල්ඩ් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්	පීවී 76140	අංක 325/3, විධානගොඩ, කුරුඳුවත්ත, ගිංතොට, ගාල්ල
රන්දිම හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්	පීවී 74855	අංක 306, හිරිගුර පාර, දංගෙදර, ගාල්ල
රංජනාස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්	පීවී 82515	අංක 248/ඒ, කටුකුරුන්ද, හබරාදුව
ගෝල් නූසරත්ෆවුන්ඩේෂන් (ගරන්ටි) ලිමිටඩ්	පීඑල් 2082	අංක 81/32, මොරිස් පාර, මිලිදඳුව, ගාල්ල
එම්. එන්. ඇසෝසියේට්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්	පීවී74332	අංක 51, තුන්වැනි පටුමග, කටුගොඩ, ගාල්ල.

එම්. එන්. ඇසෝසියේට්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.
අංක 51, තුන්වැනි පටුමග,
කටුගොඩ, ගාල්ල.
04-109

ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් වගකීමෙන් සීමිත සමාගම් 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම	පීවී අංකය	ලියාපදිංචි කළ කාර්යාලය
කඹුරුගමුව රෙසෝට් ප්‍රයිවට් ලිමිටඩ්	පීවී 84063	සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05.
ඩෙබිට් ඇන්ඩ් ඊක්විටි හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	පීවී 84102	එම සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු.

අංක 01
හැව්ලොක් පෙදෙස, කොළඹ 05.
04-114

ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 : 1 වගන්තිය අනුව දැනුම්දීම.
සමාගමේ නම : ලපැටි ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 84771
ලියාපදිංචි ලිපිනය : අංක 93/1A, 1/1A, මැනිං පෙදෙස, වැල්ලවත්ත
ලියාපදිංචි දිනය : 2012.03.09
අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.
04-44

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ,
සමාගමේ නම : පී ඇන්ඩ් ඕ හෝල්ඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 84514
සංස්ථාගත කළ දිනය : 2012.02.24
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : අංක 193/23, ප්‍රධාන පාර, මත්තේගොඩ.
ලේකම්වරු.
04-50

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.
ලියාපදිංචි සමාගමේ නම : සෙන්මෙක්ස් ප්‍රොජෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 71480
ලියාපදිංචි කළ දිනය : 2010.03.11
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 125/42, පීටර්සන් පටුමග,
කොළඹ 06.

අධ්‍යක්ෂ මණ්ඩලය.

04-150

විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමයි

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, හියාරේ, නැගෙනහිර, කපුහේන වත්ත දරන ස්ථානයේ පදිංචි දොන් සුනිල් ගුරුසිංහ (ජා. හැ. අ. 552092490 වී) වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් හේමන්ත විතාරණ මහතාගේ අංක 2045 හා 2011.11.01 දිනැති ඇටර්නි බලපත්‍රය පිට මාගේ ඇටර්නි බලකරු වශයෙන් ගාල්ල, හැව්ලොක් පාර, අංක 09 දරන ස්ථානයේ පදිංචි උඩුමලගල ගමගේ මංජුල සමන් (ජා. හැ. අ. 712492210 වී) පත්කර තිබීම මෙයින් අවලංගු කර බලරහිත කරන බවත්, එසේ හෙයින් එකී අංක 2045 දරන බලපත්‍රය පිට ඔහු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු කටයුත්තකට මා වග නොකියන බවත් සියළු දෙනාටම මෙයින් මම දැනුම් දෙමි.
2012 මාර්තු මස 16 වැනි දින.
04-48

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ අස්ගිරිය අංක 275/ඊ හි පදිංචි කදිනප්පුලිගේ ජනක ගිහාන් වික්‍රමරත්න වන මම ගම්පහ, අස්ගිරිය, බුලත්කඩේ හන්දිය අංක 275/ජේ/3 හි පදිංචි කුමාර කටුනායක අප්පුහාමිලාගේ ලක්මාල් කුමාරසිංහට ලබා දී ඇති අංක 764 දරන 2011.06.01 වැනි දින ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඉන්ද්‍රානි අත්තනායක මිය විසින් සහතික කළ විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන බවත්, 2012.03.20 වැනි දින සිට එම විශේෂ ඇටෝර්නි බලපත්‍රය කිසිදු නීත්‍යානුකූල වගකීමක් නොදරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයටත්, සාමාන්‍ය ජනතාවටත් දැනුම් දෙමි.
04-43

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගණේමුල්ල, අඹහේන, අංක 112 දරන ස්ථානයේ සහ දැනට ඉතාලිය, මිලානෝ, අංක 22/එෆ්94. සීඒපී 20148. රිසියාරෙල්ලි දරන ස්ථානයේ පදිංචි කත්තොට රාලලාගේ චන්දිමා ප්‍රියදර්ශනී මෙන්ඩිස් වන මා තමරා අබේරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2009.08.12 වන දින ලියා සහතික කළ අංක 380 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මත ගණේමුල්ල, දකුණු ගලහිටියාව, අංක 308/එෆ් දරන ස්ථානයේ පදිංචි (ජා. හැ. අංක 672624142V) හිමි ගමනායකගේ දොන් නිහාල් අරුණශාන්ත යන අයට පවරා දුන් මගේ ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මෙයින් දැනුම් දෙමි.

කේ. ආර්. චන්දිමා ප්‍රියදර්ශනී මෙන්ඩිස්.

2012ක්වූ මාර්තු මස 19 වැනි දින දී ය.
04-07

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2012 ජනවාරි මස 03 වැනි දින සංස්ථාගත කළ බවට දන්වනු ලැබේ.
සමාගමේ නම : ග්ලෝබ් ප්‍රින්ට් ඇන්ඩ් පැකේජින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 83480
ලියාපදිංචි ලිපිනය : අංක 164/2ඒ, නුවර පාර, දළුගම, කැළණිය.
04-205

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීම
සමාගමේ නම : සීමාසහිත රොවෙල් මැෂිනරි (පුද්ගලික)
ලියාපදිංචි කළ දිනය : 2011.11.23
ලියාපදිංචි අංකය : පී වී 82676
ලියාපදිංචි ලිපිනය : අංක 551/12, බණ්ඩාරනායක මාවත, ඇල්දෙනිය, කඩවත.

බිස්නස් පෑල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

04-189

දැන්වීමයි

බ්ලු පෝ ට්‍රස්ට්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීම.
බ්ලු පෝ ට්‍රස්ට් 2012 මාර්තු මස 15 වැනි දින ඇපයෙන් සීමාසහිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමු.
සමාගමේ ලියාපදිංචි අංකය : ජී ඒ 2676
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 30/42, ලොන්ග්ඩන් පෙදෙස,
කොළඹ 07.

සෙන්ට්‍රල් කෝපරේට් ඇන්ඩ් කන්සල්ටන්සි
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 116/10,
රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07.
04-192

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රත්නපුර කෙලින් වීදිය, අංක 117/ඒ දරන ස්ථානයේ පදිංචි කළුතර දේවපුරගේ ලහිරු අශාන් ප්‍රනාන්දු හෙවත් සින්තා සේනු මදාර් මොහමඩ් මස්හුද් (ජා. හැ. ප. අංක 850073660 වී) වන මා කිරිමු ලියනගේ කරුණාදාස ප්‍රසිද්ධ නොතාරිස් නීතිඥ විසින් 2010.02.04 වැනි දින ලියා සහිතක කළ අංක 428 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මත රත්නපුර කෙලින් වීදියේ අංක 117/ඒ හි පදිංචි (ජා. හැ. ප අංක 712242116 වී) හිමි මද්දුම මොහොට්ටාලගේ සජිව නිශාන්ත පෙරේරා යන අයට පවරා දුන් මගේ ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මෙයින් දැනුම් දෙමි.

කේ. ඩී. ලහිරු අශාන් ප්‍රනාන්දු හෙවත්
එස්. එස්. එම්. මොහමඩ් මස්හුද්.

2012 ක් වූ මාර්තු මස 13 වැනි දින දී ය.
04-193

නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමීව සමාගමක් ලියාපදිංචි කළ බව දැනුම් දීම.
සමාගමේ නාමය : ව්සෙල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 84519
සංස්ථාගත කළ දිනය : 2012 පෙබරවාරි 24
ලියාපදිංචි කාර්යාලය : අංක 26, රොටුන්ඩා උද්‍යානය, කොළඹ 03

සමාගමේ ලේකම්.

04-255

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

කොළඹ, හෝමාගම, උඩුවන, අංක 251 හි පදිංචි සොලමන් එරික් රිචඩ් දසනායක වන මා විසින් වාලව්චේනෙයි තැපැල් ශ්‍රී බුද්ධ ජයන්ති විහාරය පදිංචි එකී ශ්‍රී බුද්ධ ජයන්ති විහාරාධිපති නාවාතේ අභයවංශාලංකාර හිමිතැන වෙත පවරාදෙන ලද කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රාණි එස්. විදානගේ මහත්මිය විසින් ලියා සහතික කළ අංක 132 සහ 2011.04.01 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන බව සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සොලමන් එරික් රිචඩ් දසනායක.

04-256

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

කොළඹ, හෝමාගම, උඩුවන, අංක 251 හි පදිංචි විල්ෆ්‍රඩ් කෙනත් දසනායක වන මා විසින් වාලව්චේනෙයි තැපැල් ශ්‍රී බුද්ධ ජයන්ති විහාරය පදිංචි එකී ශ්‍රී බුද්ධ ජයන්ති විහාරාධිපති නාවාතේ අභයවංශාලංකාර හිමිතැන වෙත පවරාදෙන ලද කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රාණි එස්. විදානගේ මහත්මිය විසින් ලියා සහතික කළ අංක 133 සහ 2011.04.01 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන බව සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

විල්ෆ්‍රඩ් කෙනත් දසනායක.

04-257

දැන්වීම

2007ක් වූ අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සීමිත වගකීම් සහිත සමාගම සංස්ථාපනය කරන ලදී :-
සමාගමේ නම : ආතර් ඇන්ඩර්සන් සෙනෙවිරත්න ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 84780
සංස්ථාගත කළ දිනය : 2012 මාර්තු මස 9 වැනි දින
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 164/19, සමනල උයන, පිට්ටුගල, මාලබේ.

ධම්මික මනරංජන සෙනෙවිරත්න,
අධ්‍යක්ෂ.

04-239

දැන්වීමයි

ජේ. එස්. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් (පුද්.) සමාගම 2010 ඔක්තෝබර් මස 26 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.
සමාගමේ නම : ජේ. එස්. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් (පුද්.) සමාගම
සමාගම් අංකය : පී. වී. 76521
ලියාපදිංචි කාර්යාලය : අංක 3/4, හයිඩ්පාර්ක් රෙසිඩන්සින්, හයිඩ්පාක් කෝනර්, කොළඹ 02
නීතිගත කළ දිනය : 2011 ජනවාරි 12
සමාගම් ලේකම්වරුගේ නම : ජේ. එස්. ප්‍රොපෙෂනල් සර්විස් (පුද්.) සමාගම
සමාගම් ලේකම්වරුන්ගේ ලිපිනය : අංක 3/4, හයිඩ්පාර්ක් රෙසිඩන්සිස්, හයිඩ්පාක් කෝනර්, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ජේ. එස්. ප්‍රොපෙෂනල් සර්විස් (පුද්.) සමාගම.

04-211

දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය
නම : ඔරියන්ට් ග්ලෝබල් ටෙක්නොලොජි ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී බී 5000
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

සී. එස්. එමානුවෙල්,
සමාගම් ලේකම්.

2012 මාර්තු මස 06 වැනි දින.
04-212

සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නම : බේකර් ස්ට්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2012.03.09
සමාගමේ අංකය : පී. වී. 84760
ලියාපදිංචි කර්යාලයේ ලිපිනය : අංක 1 ඒ, 5 වැනි මහල, යුනිට් පෙදෙස, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,
සමාගම් ලේකම්.

අංක 1 ඒ, 5 වැනි මහල,
යුනිට් පෙදෙස,
කොළඹ 03.
04-240

වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

මහජන බැංකුව - ගාල්ල මහ විදිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2012.04.18 වැනි දින පෙ. ව. 10.30ට මෙහි පහත විස්තර වන දේපොළ එකි දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උකස්කර ඇති දේපොළ පිළිබඳ විස්තර.- දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙත්තුවේ මීපේ පිහිටි සෙන්ට්‍රල් පාර්ක් නමැති ඉඩමේ බෙදා වෙන් කළ අංක 74 දරන පර්චස් දහයයි දශම හතයි එකක් (අ. 0, රූඩ. 0, පර්. 10.71) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. සිරිවර්ධන මහතා විසින් සකස් කරන ලද 348/2003 හා 2003.06.15 දින දරන පිඹුරේ සහ එකී මිනින්දෝරු මහතා විසින් මෑතක දී සකස් කරන ලද අංක 817/2005 හා 2002.12.02 පිඹුරේ ද මෙම දේපළ පිළිබඳ සඳහන් කර ඇත.

වැඩි විස්තර සඳහා 2009.05.22 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ සහ 2009.08.14 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් හා තිනකරන් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපොළට පිවිසීමේ මාර්ගය.- ගාල්ල මාතර ප්‍රධාන මාර්ගයේ හබරාදුව නගරයෙන් වම් පසට වැටී ඇති දික්කුඹුර පාරේ කි. මී. 02 ක් පමණ ගමන් කළ විට වම් පසට වැටී ඇති ශ්‍රී ආරියවංශ මාවතේ මීටර් 600ක් පමණ ගමන් කළ විට දකුණට වැටී ඇති සෙන්ට්‍රල් පාර්ක් වෙන්දේසි ඉඩම පාරේ මීටර් 200ක් පමණ ගමන් කළ විට පාරේ වම් පස පාරට මුහුණලා මෙම දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-
01. ගැණුම් මිලෙන් 10% ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 1 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද.

වේ. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ගාල්ල, පහළ ඩික්සන් පාරේ, අංක 22 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 091-2232311, 2234785, 2234171, 2223564
ෆැක්ස් අංකය : 091-2232230

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංක : 041-2228731, 071-4438516.
04-199

සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

බස්නායක ලී වෙළඳසැල
ගිණුම් අංක : 0031 1000 3861.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 අගෝස්තු මස 04 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හතලිස් තුන් ලක්ෂ අසූ දෙදහස් තුන්සිය හතයි ශත විසි දෙකක (රු. 43,82,307.22) මුදල ද, 2010 ජූලි 06 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි හය ලක්ෂ තුන් දහස් හාරසියයක (රු. 26,03,400) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයක් (9%) හා තවත් රුපියල් පහළොස් ලක්ෂයක (රු. 15,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රවාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.09.17 දින රජයේ ගැසට් පත්‍රයේ 2010.09.08 දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2012.04.25 දින ප. ව. 2.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මොරටුව මහ නගර සභා සීමාවන් තුළ මොරටුවැල්ල ග්‍රාමයේ නව ගාලු පාරේ පිහිටි වරිපනම් අංක 370 දරන "දොඹගහවත්ත, ගොරකානවලකඩ මදනගහවත්ත, කිරිපැල්ලගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන ඒ. එස්. සී. විතානගේ යන අය විසින් සාදන ලද 2006 පෙබරවාරි 01 දාතම හා අංක 835 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 10 පළල පාර, නැගෙනහිරට : නව ගාලු පාර, දකුණට : අංක 3552 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : දුම්රිය මාර්ගය සඳහා වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හතයි එකක් (අ. 0 රූ. 0 පර්. 7.71) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, සමග එකී අංක 835 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව එම් 2551/261 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

04-218/3

ප්‍රසිද්ධ වෙන්දේසියක්

මහරගම, වත්තේගෙදර පාරේ, වරිපනම් අංක 163/1/1 සහ 163බී දරන පරිශ්‍රය තුළ පිහිටි පර්චස් 9 .97 විශාලැති අගනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බොරලැස්ගමුව වත්තේගෙදර ඔස්සේ පිහිටා ඇත්තා වූ ද, උතුරින් : වත්තේගෙදර පාරේ වරිපනම් අංක 165 දරන ඉඩමෙන් ද නැගෙනහිරින් වත්තේගෙදර පාරෙන් ද, දකුණින් වැව පාරෙන් ද හා බස්නාහිරින් බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. හතරසිංහ මහතා විසින් සාදන ලද අංක 126 දරන පිඹුරේ අංක 1 දරන බිම් කැබැල්ලෙන් ද මායිම් වූ ද, අංක 1163 දරන එකී පිඹුරේ නිරූපිත ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම නමයයි හත (අ. 0 රූ. 0 පර්. 6.97) කින් යුක්ත වූ ද, පෙර ගල්කිස්ස හා දැනට දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2377/185 හිමිකම් යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, ගොඩපරගහලන්ද, ගොරකගහකනත්ත, රිරියගහවත්ත, අලුබෝගහකනත්ත හා කජුගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. ඩී. සරත්චන්ද්‍ර මහතා විසින් සාදන ලද අංක 1163 හා වර්ෂ 1999 මාර්තු මස 18 වැනි දින දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ල හා ඒ මත පිහිටි වත්තේගෙදර පාරේ වරිපනම් අංක 163/1/1 හා අංක 163 බී දරන ගොඩනැගිලි හා වෙනත් සියලු දේ.

ඉහත ඉඩමේ නැගෙනහිර මායිමේ වත්තේගෙදර පාර හා දකුණු මායිමේ වැව පාර පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිවාසිකම් ද සමග වේ.

